සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 08 - 2023**

# නර්තනය

**කාලය පැය 02 යි**

නම / විභාග අංකය:

## I කොටස

- සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. හත්වන පා සරඹයේ සරඹ නාමය වන්නේ,
(i) සිව් අඩිය (ii) කරණම් අඩිය (iii) දෙපැති අඩිය (iv) නුහුරු අඩිය

02. ශරීරයේ විවිධ අංග වලට තලමින් නර්තනය කරන ගැමි නැටුමකි.
(i) පතුරු (ii) සවරං (iii) තාලම් (iv) ලී කෙලි

03. ''එදා නිරිඳු සදා කලිගු මැදා නුවර'' ................. මෙය
(i) පතුරු කවියකි. (ii) සිරසපාද කවියකි. (iii) ලීකෙළි කවියකි. (iv) මල්යහන් කවියකි.

04. සරල සැරසිලි අංගයකි.
(i) ගොප් ගෙඩිය (ii) පොල්තෙල් පහන (iii) අයිලය (iv) යහන

05. ''ඉසුරු දෙවිඳු වඩින දිනා''කවියේ දෙවෙනි කවි පදය වන්නේ,
(i) රඟය දැනෙයි කළ රචනා (ii) කවිය නැතිව බොරු වරුණා
(iii) කෙහෙකු විමන දැක නෙතිනා (iv) ඉසුරු දෙවිදු තුති දෙමිනා

- අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

**( පනාවිටිය අම්බලමේ, මොණරා, පත්තිනි දේවිය, භරතමුණි, හරක් බොක්කේ සිවිය)**

6. ....................................................... පහතරට බෙරයේ බෙර ඇස සඳහා යොදා ගන්නා සම් වර්ගයකි.

7. වෙස් බැඳි නැට්ටුවෙකුගේ සහ නිළියකගේ රූපයක් ....................................................... කණුවක කැටයම් කර ඇත.

8. නර්තන නිර්මාණය කළ හැකි සත්ව චරිතයක් ලෙස ....................................................... හැඳින්විය හැක.


9. පතුරු නැටුම් හා බැඳි ගායනා වලදී ....................................................... පිළිබඳව සඳහන් වෙයි

10. පුද්ගලයෙකුගේ සිතෙහි පවතින හැඟීම් සමුදාය ස්ථායී භාව නමින් හැඳින්වෙන බව ................................................... පඬිවරයා පෙන්වා දී ඇත.

■ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල වචන අතුරෙන් නොගැළපෙන වචනය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 11. කස්තිරම | අඩව්ව | කලාසම | සීරුමාරුව |
| 12. අඩිය | පස් අඩිය | තුන් අඩිය | සිව් අඩිය |
| 13. සරස්වතී | ලක්ෂ්මි | දුර්ගා | පත්තිනි |
| 14. පතුරු | සවරං | කුළු | උඩැක්කි |
| 15. හිස | ඇහිබැම | අත් | කඳ |

■ අංක 16 සිට 20 දක්වා ප්‍රහේලිකාව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.




පහළට

16. පහන් මඩුවේ දී පුද ලබයි.

17. කලාවට අධිපති ලෙස සැලකෙයි.

18. ගැමි නැටුමකි.

හරහට

19. ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායකි.

20. ශාන්තිකර්ම වලින් බැහැර වූ නර්තන අංගයකි.

(ල. 1 x 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 02කට පිළිතුරු සපයන්න.**

**(1) ඒ ඒ නර්තන සම්ප්‍රදායන්ට ආවේණික වූ වාදන භාණ්ඩ ඇත.**

1. පහතරට බෙරයේ සම්මත දිග කොපමණද?
2. එය හඳුන්වන වෙනත් නම් 2ක් සඳහන් කරන්න.
3. මෙම බෙරය සකස් කිරීමට යොදාගන්නා දැව වර්ග 2 ක් නම් කරන්න.
4. පහතරට බෙරයෙහි රූප සටහනක් ඇඳ කොටස් 3 ක් නම් කරන්න.

**(2) ද්‍රවිඩ ජනයාගේ ඉතාම උසස් වූ හින්දු ආගමික උත්සවයක් ලෙස නවරාත්‍රී උත්සවය හැඳින්විය හැකිය.**

1. නවරාත්‍රී උත්සවයේ පුද ලබන දෙවිවරු තිදෙනා නම් කරන්න.
2. එම උත්සවය පැවැත්වීමේ අරමුණු 2ක් සඳහන් කරන්න.
3. මෙම උත්සවය අවසානයේ ඇති ''විජය දසමි'' යන පූජාව පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

**(3) දේශීය නර්තන කලා ඉතිහාසය පිළිබඳව කරුණු රාශියක් රූකම් ඇසුරෙන් සොයා ගත හැක.**

1. නර්තන කලාව පිළිබඳව කරුණු සොයා ගත හැකි ගල් කැටයම් ආශ්‍රිත ස්ථාන 2ක් නම් කරන්න.
2. නර්තනය පිළිබඳව කරුණු සොයා යෑමේදී ලී කැටයම් රාශියක් එකවර දක්නට ලැබෙන ස්ථානය නම් කර, එහි දක්නට ලැබෙන සාධක 2ක් ලියන්න.
3. අනුරාධපුර කුට්ටම් පොකුණ තුළින් සොයාගත් මූර්තිය පිළිබඳව විස්තරයක් කරන්න.

**(4) ඔබ උගත් ගායන හා ප්‍රස්තාර ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

1. වෛරෝඩි වන්නමේ බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කරන්න.
2. එහි කස්තිරම ලියා දක්වන්න.
3. පතුරු හා සවරම් කවිය බැගින් ලියන්න.

**(5) පහත සඳහන් මාතෘකා වලින් 2ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.**

1. සතර බීජාක්ෂර
2. නම්‍යතා අභ්‍යාස
3. සිරසපාද කවි
4. ගොඩ සරඹ

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 08 - 2023

## නර්තනය

ප්‍රායෝගික පරීක්ෂණය

(1) ගායනය -

1. කැමති ගායනයක්. ල.5
2. නම් කරනලද ගායනය.
   (පතුරු/සවරං/සිරසපාද) ල.5

(2) 4,5,6 ගොඩ සරඹ වලින් එකක් කස්තිරම සමග. ල.10

(3) වන්නම්
වෛරෝඩි වන්නම කස්තිරම දක්වා. ල.10

(4) ගැමි නැටුම්
පතුරු/සවරං වලින් එකක් ල.10

(5) චරිත නිර්මාණය
සතුටට පත් මොණරෙක් හෝ බඩගිනි වූ සිංහයෙක් ල.10